සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

ඉස්ලාම් I
இஸ்லாம் I
Islam I

44 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** සහාබිවරු පළමුව හිජ්රත් ගිය ස්ථානය
(1) තායිෆ් ය. (2) හබෂා ය. (3) කුබා ය.
(4) ෂාම් ය. (5) යත්රිබ් ය.

**2.** 'කාෆ්ෆතුන් ලින්නාස්' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) සමස්ත මිනිස් සමාජයටම අයත් වන්නා (2) අවසාන දේවදූතයා
(3) විශ්වාසවන්තයා (4) සත්‍යවාදියා
(5) අවසන් විනිශ්චය දිනයේ උම්මත් වෙනුවෙන් අයැදින්නා

**3.** අල්ලාහ්ගේ පාරිශුද්ධ වූ නම් අතුරෙන් 'මැවුම්කරු' යන්න දක්වන වචනය වන්නේ,
(1) අර්රහ්මාන් ය. (2) අර්රස්සාක් ය. (3) අල් කාලික් ය.
(4) අල් කුද්දූස් ය. (5) අස්සලාම් ය.

**4.** අල්ලාහ් විසින් නබිවරුන්ට දායාද කළ රිසාලත්හි ඇතුළත් ප්‍රධාන කරුණු හතරක් වන්නේ,
(1) අකීදා, ඉබාදත්, ෂරීඅත් සහ සිෆාත් ය. (2) අකීදා, ඉබාදත්, ෂරීඅත් සහ අක්ලාක් ය.
(3) ඉබාදත්, අකීදා, සිෆාත් සහ අක්ලාක් ය. (4) ෂරීඅත්, ඉබාදත්, නුබුව්වත් සහ හිදායත් ය.
(5) අකීදා, හිදායත්, ඉබාදත් සහ අක්ලාක් ය.

**5.** කියාමා දිනයෙහි දක්නට ඇති 'මකාමුන් මහ්මූද්' යනු
(1) ෂෆාඅත් කිරීමට ජනයාව නබි (සල්) තුමා කැඳවාගෙන යන ස්ථානයයි.
(2) ජනයා ඒකරාශීව සිටින ස්ථානයයි.
(3) ජීවීන් ජීවය ලබා නැගිටින ස්ථානයයි.
(4) ජනතාව වටකරගෙන මලක්වරු පෙළගැසී සිටින ස්ථානයයි.
(5) කියාමා දිනයේ මුස්ලිම්වරු ජලය පානය කරන ස්ථානයයි.

**6.** ප්‍රචලිත වූ සිහාහුස් සිත්තා ග්‍රන්ථ සම්පාදනය කළ විද්වතුන් පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) බුහාරි, මුස්ලිම්, නසාඊ, ඉබ්නු හජර් (2) නවවි, නසාඊ, සුයූත්ති, තිර්මිදි
(3) අබූදාවූද්, සුයූත්ති, තිර්මිදි, ඉබ්නුල් කෙයුම් (4) බුහාරි, මුස්ලිම්, ගස්සාලි, අබූදාවූද්
(5) බුහාරි, මුස්ලිම්, තිර්මිදි, අබූදාවූද්

**7.** පහත ප්‍රකාශ සලකන්න.
A - පලස්තීනයෙහි ඉපදුණු පුද්ගලයෙකි.
B - ෆික්හුල් අක්බර් ග්‍රන්ථයේ කතෘ ය.
C - 'ආලිමුල් කුරෛෂ්' යන අන්වර්ථ නාමය සහිත පුද්ගලයා ය.
D - 'උසූලුල් ෆික්හ්' කලාවේ පුරෝගාමියා ය.
E - ඉස්තිහ්සාන් අධික ලෙස භාවිත කළ තැනැත්තා ය.
F - හනෆි මද්හබ්හි නිර්මාතෘවරයා ය.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ඉමාම් ෂාෆිඊ (රෆ්) තුමා සම්බන්ධ ප්‍රකාශ පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B, C (2) A, C, D (3) B, C, F (4) C, D, E (5) D, E, F

[ දෙවැනි පිටුව බලන්න.

Department Of Examinations , Sri Lanka

8. පහත සඳහන් සලාත අතුරෙන් 'කුත්බා' **නොපැවැත්වෙන** සලාතය
(1) ජුම්ආ ය. (2) ඉස්තිස්කා ය. (3) ඊදෙයින් ය.
(4) ජනාසා ය. (5) කුසූෆෛන් ය.

9. මුස්ලිම්වරුන් සමග හුදෛබියා සම්මුතියෙහි යෙදුණ කණ්ඩායම වන්නේ,
(1) අව්ස් ගෝත්‍රිකයන් ය. (2) කුරෛෂික් ගෝත්‍රිකයන් ය.
(3) කස්රජ් ගෝත්‍රිකයන් ය. (4) අහ්ලුල් කිතාබ්වරු ය.
(5) තායිෆ්වාසීන් ය.

10. ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගෙන් බහුතරයක් අනුගමනය කරන මද්හබ් වන්නේ
(1) මාලිකි ය. (2) ජඃෆරි ය. (3) හනෆි ය. (4) හම්බලි ය. (5) ෂාෆිඊ ය.

11. "මුස්ලිම්වරයකු සිටුවන ලද පැළයක් හෝ කරන ලද වගාවක් තුළින් පක්ෂියෙකු, සතෙකු හෝ මිනිසෙකු ප්‍රයෝජන ලබා ගන්නා තාක්කල්, එය ඔහුට සදකාවක් වන්නේ ය" යන හදීස් පහත කුමකින් සඳහන් කරයි ද?
(1) කිලාෆත් (2) වසියියත් (3) ඉමාරත් (4) නසීහත් (5) අමානත්

12. 'නිශ්ශබ්දතාවය පිළිගැනීම යන්නෙහි සංකේතයකි' යන අදහසින් යුත් ඉජ්මාඋ කුමක් ද?
(1) ඉජ්මාඋ ඉජ්තිහාදි (2) ඉජ්මාඋ මුරක්කබ් (3) ඉජ්මාඋ නක්ලි
(4) ඉජ්මාඋ සුකූති (5) ඉජ්මාඋ අක්සරියියා

13. "මතුලොව මුඃමින්ගේ මීසාන්හි යහපත් චර්යාවන්ට වඩා වැඩි බරක් සහිත වෙනත් දෙයක් තිබිය නොහැකි ය." යනු
(1) අල්-කුර්ආන් වදනකි. (2) නබි (සල්) තුමාගේ හදීසයකි.
(3) ඉමාම්වරයෙකුගේ ප්‍රකාශයකි. (4) සහාබිවරයෙකුගේ අදහසකි.
(5) පැරණි කියමනකි.

14. දික්කසාද වූ ස්ත්‍රියක් නැවත බිරිඳක් බවට පත් කරගැනීම සඳහා ඉස්ලාම් අනුමත කර ඇති දික්කසාද ක්‍රමය වන්නේ
(1) තලාක් බායින් ය. (2) ඊලාඋ ය. (3) ලිආන් ය. (4) තලාක් රජඊ ය. (5) ෆස්කු ය.

15. ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් අතර පිබිදීමක් ඇති කිරීමට සිද්දිලෙබ්බේ විද්වතා විසින් ප්‍රකාශිත පුවත්පතේ නම කුමක් ද?
(1) මුස්ලිම් නේසන් (2) පුදිනාලංකාරි (3) අස්රාරුල් ආලම්
(4) මුස්ලිම් පාදුකාවලන් (5) අස්සවාබ්

16. පහත වාක්‍ය අතුරෙන් විවිධ ආගම්වල පැවැත්ම ඉස්ලාම් පිළිගනී යන්න වඩා හොඳින් විස්තර කරන අල්-කුර්ආන්හි වාක්‍යය කුමක් ද?
(1) "ලෝකයේ සිටින සියලුම මිනිසුන් ගෞරවනීයයි. එම ගෞරවය අල්ලාහ් විසින් මිනිසාට දායාද කළේ ය."
(2) "ආගමෙහි බලකිරීමක් නැත, ඇයි ද යත් වැරදි මාර්ගයේ සිට ඍජු මාර්ග පැහැදිලි විය."
(3) "ජනයිනි! අප ඔබව සැබැවින්ම එක් පිරිමියෙකුගෙන් සහ එක් ස්ත්‍රියකුගෙන් මැව්වෙමු."
(4) "ඔබගේ දෙවියන් අපේක්ෂා කළේ නම් භූමියේ සියලුදෙනා ඊමාන් වූ අය වීමට තිබුණි. එලෙස වීමට ඔබගේ දෙවියන් අකමැති විය."
(5) "අහස් භූමිය මැවීම සහ පිහිටීම, ඔබගේ භාෂාවන්, වර්ණයන් වෙනස්ව පැවතීම ඔහුව පෙන්වීමේ සාක්ෂීන්ට අයත් වේ."

17. 'අහ්ලුල් බෛත්' යන විශිෂ්ඨ නාමයෙන් හඳුන්වන්නන් වන්නේ,
(1) නබි (සල්) තුමා සමග හිජ්රත් ගිය අය ය.
(2) නබි (සල්) තුමාව ඍජුව හමුවූ මුස්ලිම්වරු ය.
(3) හිජ්රි පළමු අර්ධ ශතකයේ ජීවත් වූවන් ය.
(4) නබි (සල්) තුමාගේ සමයේ ජීවත් වූවන් ය.
(5) නබි (සල්) තුමාගේ පවුලේ අය සහ භාර්යාවන් ය.

18. තර්තීබ් තිලාවත්, තර්තීබ් නුසූල් පිළිවෙළින් දක්වන්නේ,
(1) අල්-කුර්ආන් පහළ කරන ලද ක්‍රමය සහ පාරායනය කරන ලද ක්‍රමය යන්නයි.
(2) අල්-කුර්ආන් පාරායනය කරන ලද ක්‍රමය සහ පහළ කරන ලද ක්‍රමය යන්නයි.
(3) අල්-කුර්ආන් පහළ කරන ලද ක්‍රමය සහ ලේඛනගත කරන ලද ක්‍රමය යන්නයි.
(4) අල්-කුර්ආන් සම්පාදනය කරන ලද ක්‍රමය සහ පාරායනය කරන ලද ක්‍රමය යන්නයි.
(5) අල්-කුර්ආන් සංවිධානය කරන ලද ක්‍රමය සහ පාරායනය කරන ලද ක්‍රමය යන්නයි.

Department of Examinations, Sri Lanka

**19.** ශ්‍රී ලංකීය මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය සමග සම්බන්ධ වූ වැදගත් තොරතුරු සහිත ග්‍රන්ථ පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) ෆුතූහුල් බුල්දාන් සහ අර්රහීකුල් මක්තූම්
(2) කිතාබුල් උම්මු සහ අහ්කාමුස් සුල්තානියා
(3) මුකද්දිමා ඉබ්නු කල්දූන් සහ කිතාබු තබකාත් අල් කබීර්
(4) තාරීහුල් කබීර් සහ තාරීහුල් රුසුල් වල්මුලූක්
(5) අජාඉබුල් හින්දි සහ ෆුතූහුල් බුල්දාන්

**20.** සූරතුල් බකරාව පාරායන කළ පසු කවි ලිවීම අත්හරින ලද්දේ කුමන කවියා ද?
(1) ඉම්රුඋල් කෛස්
(2) උත්බා බින් ආමිර්
(3) වලීද් බින් මුකීරා
(4) අල් මුතනබ්බි
(5) අල් කන්සා

**21.** අහ්ලුස් සුන්නා වල්ජමාආවල අකීදා ගොඩනගා ඇති ප්‍රධාන පදනම/පදනම් මොනවා ද?
(1) සංවේදන සහ තර්කිකත්වය
(2) දේව මගපෙන්වීම
(3) මිත්‍යා විශ්වාස හා බැඳී දේව මගපෙන්වීම්
(4) සිහින සහ උපකල්පන
(5) මිනිස් හැඟීම් සහ මගපෙන්වීම්

**22.** 'සහීෆා සාදිකා' නම් හදීස් සංග්‍රහය කවුරු විසින් ලියන ලද්දේ ද?
(1) අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් ඉබ්නුල් ආස් (රලි)
(2) අබ්දුල්ලාහ් ඉබ්නු ජඃෆර් (රලි)
(3) අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස් (රලි)
(4) අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රලි)
(5) අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රලි)

**23.** අබු අස්වද් අද්දුවලි විසින් අල්-කුර්ආන් වැකිවලට පිල්ලම් යෙදූ සිද්ධිය කුමන කලීෆා යුගයේ සිදු වූයේ ද?
(1) අබූබක්ර් (රලි)
(2) උමර් (රලි)
(3) උස්මාන් (රලි)
(4) අලි (රලි)
(5) උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්)

**24.** ඉමාම් අබූහනීෆා (රහ්) තුමාගේ ශිෂ්‍යයෙක් වන්නේ,
(1) මුස්නි ය.
(2) අබුල් කාසිම් ය.
(3) අෂ්ෂෛබානි ය.
(4) බුවෛදි ය.
(5) ඉබ්නු තෛමියා ය.

**25.** "අල්-කුර්ආනය මවන ලද්දකි" යනුවෙන් ප්‍රකාශ කරන ලද කණ්ඩායම වන්නේ,
(1) මුඃතසිලාවරු ය.
(2) මුර්ජිආවරු ය.
(3) කවාරිජ්වරු ය.
(4) ෂීආවරු ය.
(5) ජබරියියාවරු ය.

**26.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් සෙංකඩගල රාජධානියේ මුස්ලිම්වරු දේශපාලන වශයෙන් ලබා තිබූ පිළිගැනීමට සාක්ෂි දරන ප්‍රකාශය කුමක් ද?
(1) ක්‍රි.ව. 1762 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට පැමිණි ඉංග්‍රීසි තානාපති ජෝන් පෛබස් නැමැත්තා පිළිගෙන කැඳවාගෙන ඒමට එවක රජු විසින් උදුමාන් ලෙබ්බෙව යැව්වේ ය.
(2) මායාදුන්නේ (1521-1581) රජ සමයේ දී මුස්ලිම්වරු පෘතුගීසීන්ට විරුද්ධව එම රජුගේ හමුදාවට බැඳී යුද්ධ කළහ.
(3) විජයබාහු (1055-1110) රජ සමයේ දී පෙරිය තම්බි මරික්කාර් ලෙස හැඳින්වූ මුස්ලිම්වරයෙකු වාණිජ ක්ෂේත්‍රයේ සම්බන්ධීකාරක ලෙස සේවය කර ඇත.
(4) මහා පරාක්‍රමබාහු (1153-1186) රජ සමයේ මුස්ලිම්වරු වෙළඳ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා වන 'අන්දරංගදූර' යන ඉහළ සභාවේ සාමාජිකත්වය ලබා සිටියේ ය.
(5) ක්‍රි.ව. 1270 දී දඹදෙණියේ ඇති වූ කෝලාහලය මැඩපවත්වා පළමුවන බුවනෙකබාහු රජතුමා හට යාපහුව අගනුවර කරගනිමින් බලයට පත්වීම සඳහා මුස්ලිම් සෙන්පතියෙක් වූ තාහෝර් සහාය වන ලදී.

**27.** අල්-කුර්ආනයෙහි සඳහන් පරිදි රමලාන් උපවාසය මගින් අපේක්ෂා කරන ප්‍රධාන වාසිය කුමක් ද?
(1) ශරීර සෞඛ්‍ය සම්පන්න වීම
(2) දුගීන්ගේ කුසගින්න පිළිබඳ හැඟීමක් ඇති වීම
(3) පාපී ක්‍රියාවන්ගෙන් ආරක්ෂාවීමට මගපෙන්වීම
(4) අවදිව සිට යාච්ඤා කිරීමට දිරිගැන්වීම
(5) දේව භක්තිය ඇති වීම

Department of Examinations, Sri Lanka

**28.** මියගිය තැනැත්තකුගේ දේපළ වලින් ඉටුකළ යුතු කාර්යයන් පහතින් දක්වා ඇත.

A - ජනාසාවට අදාළ වියදම්
B - වසියියත්
C - මියගිය තැනැත්තාගේ ණය
D - උරුමකරුවන් අතර දේපළ බෙදීම

ඉහත කාර්යයන් ඉටු කළ යුතු නිවැරදි අනුපිළිවෙළ ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, C, D (2) A, C, B, D (3) B, A, C, D (4) C, A, B, D (5) D, A, B, C

**29.** අබූබකර් (රලි) තුමා තම පාලන සමයේ ඉටු කළ කාර්යයක් **නොවන්නේ**,

(1) මජ්ලිසුෂ් ෂූරාව ස්ථාපිත කිරීම ය.
(2) අල්-කුර්ආන් එක්රැස් කිරීම ය.
(3) ව්‍යාජ නබිවරුන්ට විරුද්ධව සටන් වැදීම ය.
(4) සකාත් දීම ප්‍රතික්ෂේප කළ අයට විරුද්ධව අරගල කිරීම ය.
(5) උසාමා (රලි) ගේ නායකත්වය යටතේ හමුදාවක් සිරියාවට යැවීම ය.

**30.** මුස්ලිම් ගොවියෙකු වී වගාවෙහි යෙදී කිලෝ ග්‍රෑම් 3000ක වී අස්වැන්නක් ලබා ගත්තේ ය. ඔහුගේ කුඹුරට ජල සම්පාදනය රජය විසින් සපයයි නම්, ඔහුගේ අස්වැන්නෙන් ගෙවිය යුතු සකාත් ප්‍රමාණය වී කිලෝ ග්‍රෑම් කොපමණ ද?

(1) 150 (2) 200 (3) 250 (4) 300 (5) 350

**31.** වෙනත් පුද්ගලයකු කෙරෙහි ඊර්ෂ්‍යාව ඇතිවීමෙන් වැළකීම සඳහා නබි (සල්) තුමා පෙන්වාදුන් විධික්‍රමය කුමක් ද?

(1) ඊර්ෂ්‍යාව යනු ලෞකික ආශාවන් වෙනුවෙන් ලුහුබැඳීමේ ස්වභාවය මිනිසා තුළ ඇති කරන බව සිතීම
(2) සමාජීය උස් පහත් භාවයට හේතුවන්නේ දෙවියන්ම ය යන්න සිතෙහි ගැඹුරින් ධාරණය කර ගැනීම
(3) ඊර්ෂ්‍යාවෙන් තමන්ට ඇතිවන නපුරුකම්වලට දෙවියන්ගෙන් ආරක්ෂාව පැතීම
(4) තමන්ට වඩා තත්වයෙන් පහත් අය දෙස බලා අල්ලාහ්ගෙන් ලද දයාද පිළිබඳව ආඩම්බර වීම
(5) ධනවත් පුද්ගලයකුට හෝ ඥාණවන්තයෙකුට දී ඇති ආකාරයට තමන්ටත් ලදහොත් තමන්ට ද යහක්‍රියා කළ හැකි යැයි සිතීම

**32.** ඉස්ලාමික ගනුදෙනු හා සම්බන්ධ **වැරදි** පිළිවෙත කුමක් ද?

(1) ඉස්ලාමික බැංකුවකින් මුස්ලිම්වරයකු තම අවශ්‍යතා සඳහා ණයක් ලබා ගන්නා විට තවත් මුස්ලිම්වරයකු ඇපකරුවකු වීම ආගමිකව අනුමත කර ඇත.
(2) කුලියට ලබාගත් උපකරණයක් ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් ප්‍රති උපකාර ලෙස නියමිත මුදල් වටිනාකමක් ගෙවීම සුදුසු ක්‍රියාවකි.
(3) ණයක් ලබාගත් තැනැත්තා එම ණය ආපසු ලබාදෙන තෙක් උගස් කළ භාණ්ඩයෙන් හෝ දේපළෙන් ප්‍රතිලාභයක් ලබා ගැනීමට ආගමෙන් අනුමැතිය දී ඇත.
(4) විකුණන්නා සහ මිල දී ගන්නා අතර සම්බන්ධීකරණය කරන තැරැව්කරුවකු, එම සේවාව සඳහා සාධාරණ කුලියක් ලබා ගැනීමේ වරදක් නොමැත.
(5) රෝගයක් හෝ අනතුරක් හේතුකොට ගෙන, යම් කටයුත්තක් සඳහා තමාට සහභාගිවිය නොහැකි අවස්ථාවක තමන් වෙනුවෙන් වෙනත් කෙනෙකු වගකිව යුත්තා ලෙස පත් කිරීම ආගමෙහි අනුමත කර ඇත.

**33.** සමාජීය කටයුතු සම්බන්ධ වගකීම්වලට මුස්ලිම්වරයකු පත් කිරීමේ නිවැරදි පිළිවෙත කුමක් ද?

(1) ඉහළ දැනුම, බලය, වගකීම, ආකර්ෂණීය ගතිලක්ෂණ සහ ජනතාව සමග සුහදශීලීත්වය, සහිත අල්ලාහ්ට වඩාත් සමීප කෙනෙකුව තනතුරට පත් කිරීම
(2) තම කණ්ඩායම වෙත ආදරය, කරුණාව සහිත කෙනෙකු කණ්ඩායමේ නායකයා ලෙස පත් කිරීම
(3) අවසාන විනිශ්චය දිනයේ තම ගෞරවය අහිමි වී අවමානයට ලක් වන බැවින් දුර්වල පුද්ගලයකු අදාළ තනතුරට පත් නොකිරීම
(4) අල්ලාහ්ට වඩාත් කැමති කෙනෙක් සිටිය දී, ඔහුව හැර වෙනත් කෙනෙකුව පත් නොකිරීම
(5) තම සේවා කාලය තුළ කැපවීමෙන් සේවය කරන්නෙකු පත් කිරීම

Department of Examinations, Sri Lanka

**34.** පහත ප්‍රකාශ සලකන්න.

A - දෙවියන් මවා ඇති ස්වාභාවික සම්පත් සමග මිනිසාගේ උත්සහයන් සම්බන්ධවන විට අවසාන භාණ්ඩ නිෂ්පාදනය වේ.

B - ලෝකයේ ජීවත්වන සෑම මිනිසෙකුටම භාණ්ඩ පරිභෝජනය කිරීමේ අයිතිය තමා උපදින අවස්ථාවේම ලැබෙයි.

C - ආඩම්බරකම, උඩඟුකම, මහත් තත්ත්වය, ගෞරවය වැනි දෑ භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ දී වැලකී සිටිය යුතු අංග වේ.

D - භාණ්ඩවල සහ සේවාවන්වල පාරිභෝජනය යම් පාරිභෝජන නියමයන්ට අනුව සිදුවන අතර ඒවා උල්ලංඝනය කරන විට දේව දඬුවම්වලට ලක්වීමට සිදු වේ.

E - ජනයාට හානි සිදුකළ හැකි මත්ද්‍රව්‍ය වැනි දේ නිෂ්පාදනය කිරීම හා වෙළෙඳාම් කිරීම තහනම් කළ හැකි පරිදි නීති සම්පාදනය කර ඇත.

ඉහත ප්‍රකාශ අතුරෙන් පරිභෝජනය පිළිබඳ ඉස්ලාමික සංකල්පය පැහැදිලි කරන ප්‍රකාශ පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, C (2) A, B, E (3) B, C, D (4) B, C, E (5) C, D, E

**35.** ඉස්ලාමීය විවාහ සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.

A - පිරිමියකු සමකාලීනව එක් ස්ත්‍රියකට වඩා වැඩි ගණනක් නිශ්චිත කාලයක් සඳහා සම්මුති පදනමෙන් තම භාර්යාවන් ලෙස පිළිගැනීම.

B - නබි (සල්) තුමාට පෙර බිහි වූ ඉබ්‍රාහීම් (අලෛ) සහ සුලෛමාන් (අලෛ) වැනි අය බහු විවාහ සිදුකොට ජීවත් වූ ආකාර සම්පූර්ණයෙන් අනුගමනය කිරීම.

C - ස්ත්‍රියකගේ ශාරීරික අවශ්‍යතා සපුරාලීමේ ශක්තිය, ඇයව සම්පූර්ණයෙන් නඩත්තු කිරීමේ ආර්ථික හැකියාව ආදිය තිබෙන විට ස්ත්‍රීන් හතරකට වඩා වැඩි නොවන පරිදි විවාහ වීම.

D - භාර්යාවන් අතර ස්වාමි පුරුෂයකු හදවතින්ම ආදරය සමානව බෙදා දීම කළ හැකි දෙයක් නොවන බව භාර්යාවන් වටහා ගැනීම.

E - සියලුම භාර්යාවන්ට එකසේ සැලකීමට නොහැකි පිරිමියකු එක් ස්ත්‍රියක් සමග පමණක් විවාහ වීම.

ඉහත ප්‍රකාශ අතුරෙන් බහු විවාහ පිළිබඳව නිවැරදි ඉස්ලාමික ප්‍රකාශ පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, C (2) A, B, D (3) B, C, D (4) B, D, E (5) C, D, E

**36.** ඉස්ලාම් දහම හඳුන්වාදීම පිළිබඳව පහත ප්‍රකාශ සලකන්න.

A - ක්‍රි.ව. 610 කාලයේ දී ඉන්දියානු වෙරළ තීරයේ ශක්තිමත් වෙළෙඳුන් ලෙස අරාබියානුවන් ස්ථාපිත වී සිටිය හ.

B - නබිතුමාගේ තානාපති ලෙස චීනයට ගිය වහබ් ඉබ්නු අබී හබ්සා (රළි) ශ්‍රී ලංකාවට ද පැමිණ ශ්‍රී ලංකාවේ රජතුමාට ඉස්ලාම් දහම පිළිබඳ පණිවිඩය ප්‍රකාශ කළේ ය.

C - ශ්‍රී ලංකාවේ අග්ගබෝධි III රජු විසින් අරාබියාවට (මදීනා) යැවූ තානාපතිගේ සහායකයා ශ්‍රී ලංකාවට නැවත පැමිණ ඉස්ලාම් පිළිබඳ පණිවිඩය ප්‍රකාශ කළේ ය.

D - හජ්ජාජ් බින් යූසුෆ්ගේ හිංසනයෙන් බිය වූ හාෂිම් පාර්ශවයේ පුද්ගලයින්ගෙන් කොටසක් අරාබියෙන් බැහැරව දකුණු ඉන්දියානු වෙරළ තීරයේ සහ ශ්‍රී ලංකාවේ උතුරු හා දකුණු වෙරළ තීරයන්හි ද පදිංචි වූ හ.

E - පණ්ඩුකාභය රජු අනුරාධපුරය පාලනය කළ යුගයේ අගනුවර අරාබි වෙළෙඳුන් සඳහා ප්‍රදේශ කිහිපයක් වෙන්කර තිබුණි.

ඉහත ප්‍රකාශවලින් ශ්‍රී ලංකාවේ ඉස්ලාම් දහම හඳුන්වාදීම පිළිබඳ අදහස් පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, C (2) A, C, D (3) B, C, D (4) B, D, E (5) C, D, E

**37.** පහත සඳහන් යුතුකම් පිළිබඳව සලකන්න.

A - පස්වේල් වන්දනාව

B - මාර්ග පිළිසකර කිරීම

C - වේතනයට අනුව සේවය කිරීම

D - දෙමව්පියන්ට සැලකීම

E - පල්ලියක් ගොඩනැගීම

F - ස්වාමි පුරුෂයා තම පවුලට වියදම් කිරීම

ඉහත සඳහන් දෑ අතුරෙන් 'ෆර්ලු අයින්' හා සම්බන්ධ වූ යුතුකම් පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, C, D (2) A, B, C, F (3) A, C, D, F (4) B, D, E, F (5) C, D, E, F

Department of Examinations, Sri Lanka

**38.** පහත සඳහන් දේ සලකන්න.

A - ඕනෑම මාසයක ඉටු කිරීම
B - තවාෆ් කිරීම
C - සෑයු කිරීම
D - නිශ්චිත දිනවල ඉටු කිරීම
E - අරෆාහි රැඳී සිටීම
F - මස්ජිදුන් නබවි වන්දනා කිරීම

ඉහත දේ අතුරෙන් හජ් සමග සම්බන්ධ වූ යුතුකම් පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, C, D (2) A, B, E, F (3) A, D, E, F (4) B, C, D, E (5) C, D, E, F

**39.** පහත ප්‍රකාශ සලකන්න.

A - ස්වාමියා හා භාර්යාව අතර මානසික සැනසීම, ආදරය, බැඳීම ආදිය තුළ එකිනෙකා උදව් වීම
B - වෛෂ්‍යා වෘත්තිය, සමලිංගිකත්වය, ස්වයං වින්දනය ලැබීම වැනි නුසුදුසු පුරුදුවලින් වැලකී සිටීම
C - ශරීර සෞඛ්‍යය සහ ආර්ථික පහසුකම් ඇති තරුණයන්ට විවාහ විය හැකි වීම
D - ස්වාමියා හා භාර්යාව අතර වගකීම් බෙදා ගැනීම මගින් නිරෝගීමත් පවුලක් හා සමාජයක් බිහිවීමට මඟ පෑදීම
E - ඉස්ලාමයේ විවාහය මිනිස් ජීවිතයේ පදනම ලෙස සැලකේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් ඉස්ලාම් දහමේ සඳහන් විවාහයේ අරමුණු පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, C (2) A, B, D (3) A, C, E (4) B, C, D (5) C, D, E

**40.** ස්වාමියා මරණයට පත් වූ පසු ගර්භණී ස්ත්‍රියක් ඉද්දා සුරැකිය යුතු කාල සීමාව කොපමණ ද?

(1) මාසයක්
(2) ඔසප් කාල තුනක්
(3) මාස තුනක්
(4) මාස හතරක් සහ දින දහයක්
(5) ප්‍රසූතිය සිදුවන කාලය දක්වා

**41.** හදීස්වලින් ඉතා උසස් තත්වයේ හදීස් ලෙස සලකනු ලබන්නේ

(1) මුතවාතිර් ය. (2) සහීහ් ය. (3) හසන් ය. (4) මව්ලූද ය. (5) මර්ෆූඋ ය.

● අංක **42** සිට **45** දක්වා වූ සෑම ප්‍රශ්නයකට ම **X** සහ **Y** යන තීරු යටතේ තොරතුරු ලබා දී ඇත. **X** තීරුවේ ඇති තොරතුරු **Y** තීරුවේ ඇති තොරතුරු සමග කිසියම් හෝ ආකාරයකට සම්බන්ධ වේ. එහෙත් ඒවා අනුපිළිවෙළින් නොපවතී. ඒ අනුව **X** තීරුවේ දී ඇති පිළිවෙළට **Y** තීරුවේ ඇති තොරතුරු ගැළපෙන පරිදි අනුපිළිවෙළට සැකසීමේ දී නිවැරදිව ලැබෙන පිළිතුර තෝරන්න.

**42.**

| X | Y |
|---|---|
| (i) තෞහීද් අස්මා වස්සිෆාත් | A - හදීස් එක් රැස් කිරීම |
| (ii) සහාත් ලැබීමට නුසුදුස්සන් | B - අහ්ලුර් රඃයි |
| (iii) ශිහාබුද්දීන් සුහ්රි (රහ්) | C - ජීවිතය ආරක්ෂා කර ගැනීම |
| (iv) හනෆි මද්හබ් | D - අල්ලාහ්ට සමානව කිසිවක් නැත |
| (v) ළරූරියියාත් | E - නබි (සල්) තුමාගේ පවුලේ අය |

(1) A, B, C, D, E (2) B, C, D, E, A (3) C, D, E, A, B
(4) D, E, A, B, C (5) E, A, B, C, D

**43.**

| X | Y |
|---|---|
| (i) තක්වා | A - අල්ලාහ් කෙරෙහි තම කාර්යයන් මුළුමනින්ම පැවරීම |
| (ii) තවක්කුල් | B - ලෞකික ආශා හා තපස්වරය අතර සමබරතාවය රැකීම |
| (iii) රිළා | C - දෙවියන්ට බියවන ආකාරයට මිනිස් ක්‍රියා පැවතීම |
| (iv) සුහ්ද් | D - පව් ලෙස සැක කරන දේ අත්හැරීම |
| (v) වරඃ | E - දෙවියන්ගේ තීරණ ගැන තෘප්තිමත් වීම |

(1) A, B, C, D, E (2) B, C, D, E, A (3) C, A, E, B, D
(4) D, A, E, B, C (5) E, A, B, C, D

Department Of Examinations , Sri Lanka

[ හත්වැනි පිටුව බලන්න.

**44.**

| X | Y |
|---|---|
| (i) සාමාන්‍ය අපරාධ | A - ජරාඉමුල් හුදූද් |
| (ii) පලිගත හැකි සහ වන්දි ලබාගත හැකි අපරාධ | B - සරිකා |
| (iii) සොරකම හා සම්බන්ධ අපරාධ | C - තඃසීර් |
| (iv) මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ අපරාධ | D - ජරාඉමුල් කිසාස් වද්දියා |
| (v) දඬුවම් නිශ්චය කරන ලද අපරාධ | E - ෂුර්බුල් කම්ර් |

(1) A, B, C, D, E (2) B, C, D, E, A (3) C, D, B, E, A
(4) D, E, A, B, C (5) E, A, B, C, D

**45.**

| X | Y |
|---|---|
| (i) තුන්වන ස්ථානයේ පාරම්පරික උරුමයෙන් ලැබෙන පංගු ලබන්නන් | A - අසබා |
| (ii) අල්-කුර්ආන් සහ සුන්නාහි වරාසත් කොටස් පැහැදිලිව සඳහන් කර ඇති අය | B - හජ්බු නුක්සාන් |
| (iii) පාරම්පරිකව උරුම දේපළවලින් ප්‍රධාන පංගු බෙදීමෙන් පසු ශේෂ වූ කොටස ලබන්නන් | C - හජ්බු හිර්මාන් |
| (iv) ඇතැමුන්ට ලැබීමට නියමිතව තිබූ පාරම්පරික උරුම කොටස් අඩු වීම | D - දුල්-අර්හාම් |
| (v) ඇතැමුන්ට ලැබීමට නියමිතව තිබූ පාරම්පරික උරුම කොටස් සම්පූර්ණයෙන් නැති වී යාම | E - අස්හාබුල් පුරූල් |

(1) A, B, C, D, E (2) B, C, D, E, A (3) C, D, E, A, B
(4) D, E, A, B, C (5) E, A, B, C, D

Department Of Examinations, Sri Lanka

- අංක **46** සිට **50** දක්වා ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2), (3), (4), (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යුගලය සහිත වරණය තෝරා එහි අංකය පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | වැරදි ය. | නිවැරදි ය. |
| (3) | නිවැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | වැරදි ය. |
| (5) | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමුවන ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **46.** | නබි (සල්) තුමා තමාට වහි ලෙස දැනුම් නොදුන් කරුණු තම ඉජ්තිහාද් භාවිතකොට විනිශ්චයන් ලබා දී ඇත. | මුආද් ඉබ්නු ජබල් (රළි) තුමා යෙමන් රටේ ආණ්ඩුකාරවරයා ලෙස යැවූ විට ඔහුට තම ඉජ්තිහාද් පදනමින් ක්‍රියා කිරීමට අනුමැතිය ලැබුණි. |
| **47.** | සියලු ජනයාට ප්‍රමාණවත් ආහාර, ඇඳුම්, ජීවත් වීමට නිවාස ආදිය සම්පූර්ණ කළ යුතු ය යන්න ඉස්ලාම් හි ඉතා වැදගත් වේ. | සදකා, හිබත්, හදියා, අකීකා, උල්හියියා ආදිය ඉස්ලාම් සඳහන් කරන ධනය බෙදීමේ අංගවලින් කිහිපයකි. |
| **48.** | ඉස්ලාම් දහම දුප්පත්කම ගරුකොට එය දේව දායාදයක් ලෙසත්, එය ඉවත් නොකළ යුතු බවත් සලකයි. | නබි (සල්) තුමා තම ජීවිත කාලය පුරාම දුප්පත්ව ජීවත් වී අනෙක් අයත් දුප්පත්කමින් ජීවත් වීමට දිරිගැන්වූවේ ය. |
| **49.** | නබි (සල්) තුමා තම පවුල වෙනුවෙන් වසරකට ප්‍රමාණවත් ආහාර ද්‍රව්‍ය රැස්කොට තිබූ බව උමර් (රළි) තුමා සඳහන් කර ඇත. | මුස්ලිම්වරයකු තම මරණයෙන් පසු දරුවන්ගේ අනාගතය සඳහා යම් දේපළක් තබා යෑම ඉස්ලාම් දහමේ දිරි ගැන්වූයේ නැත. |
| **50.** | ආකර්ෂණීය උපක්‍රම, රැවටිලි ඉදිරිපත් කොට නිෂ්පාදනය විකුණා අධික ලාභ ලබන වෙළඳාම ඉස්ලාම් දහම පිළිගන්නා උත්සාහයක් ලෙස සලකයි. | අල්ලාහ්ගේ තෘප්තිය ලබාගත් ව්‍යාපාරිකයාට 'අත්තාජිරුස් සදූක්' යැයි නබි (සල්) තුමා පෙන්වා දී ඇත. |

* * *

Department Of Examinations , Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

ඉස්ලාම් II
இஸ்லாம் II
Islam II

**44 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

✳ **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) 'හුකුකුල් ඉබාද්' යන්න අර්ථකථනය කරන්න. (ලකුණු 02යි)

(ii) ඥාතීන් සහ අසල්වැසියන් වෙනුවෙන් මුස්ලිම්වරයකු විසින් ඉටු කළ යුතු යුතුකම් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) ජමාඅත් සලාතය තුළින් අත්වන සමාජීය ප්‍රයෝජන **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(iv) සකාත් සාමූහිකව ඉටු කළ යුත්තේ ඇයි දැයි කරුණු **හතරකින්** පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

2. (i) උලූමුල් කුර්ආන් කලාවේ මුහ්කම් හා මුතෂාබිහ් යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 02යි)

(ii) පිරිමියකුට තාවකාලිකව විවාහ කර ගැනීමට අවසර දී **නොමැති හතරදෙනෙකු** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) ඉස්ලාම් දහමෙහි සඳහන් යහපත අණ කරන සහ අයහපත වළක්වන පුද්ගලයන් සතුව තිබිය යුතු සුදුසුකම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(iv) 'වහ්දතුල් වුජූද්' යන්න අර්ථ දක්වා, එහි බිහිවීම හා විකාශනය පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

3. (i) ඉද්දාහි අරමුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ii) මියගිය පුද්ගලයකුගේ දේපළක් එහි උරුමකරුවන් වන පිරිමි සහ කාන්තාවන් අතර සමානව බෙදනු ලබන අවස්ථා **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) 'තශව්වුෆ්' යන්න අර්ථකථනය කොට, එහි බිහිවීමේ පසුබිම පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(iv) මුස්ලිම්වරයකු ගනුදෙනුවල යෙදීමේ දී පිළිපැදිය යුතු සම්ප්‍රදායික වටිනාකම් **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

[ දෙවැනි පිටුව බලන්න.

Department Of Examinations, Sri Lanka

## II කොටස

**4.** (i) අල්-කුර්ආනය අවබෝධ කර ගැනීමට හදීස් උපකාරීවන ආකාර සඳහන් කොට, ඒවායින් **දෙකක්** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) තාබිඊන්වරුන්ගේ සමයේ හදීස් ග්‍රන්ථකරණය සිදු වූ ඉතිහාසය කෙටියෙන් පැහැදිලි කර, ඒ තුළින් මුස්ලිම් සමාජයට ලැබුණු සාධනීය තත්ත්වයන් **හතරක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

**5.** (i) "ෂරීආ වෙනස් වී තිබුණත් ඉස්ලාම් කවදත් ස්ථාවර දීන් වශයෙන් පවති." පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) මතභේද ඇති වූ විට අනුගමනය කළ යුතු විනය පිළිවෙත් **පහක්** ඉස්ලාමීය දෘෂ්ටිකෝණයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**6.** (i) මුස්ලිම්වරයකුගේ ගෘහ ආශ්‍රිත පරිසරය යහපත්ව පවත්වාගෙන යාමට ඉස්ලාම් දහමෙහි සඳහන් කොට ඇති ඉගැන්වීම් **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) "පවුල් ජීවිතයේ දී පුරුෂයා සහ භාර්යාව මුහුණදෙන ප්‍රශ්නවල දී ඒවා විසඳීම සඳහා ඉස්ලාම් දහම වඩා යහපත් ක්‍රමවේදයක් ඉදිරිපත් කොට ඇත." පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**7.** (i) ජාහිලියයා යුගයේ සමාජය තුළ පැවති වැරදි සහගත හැසිරීම් **පහක්** සඳහන් කර, ඉස්ලාම් ඒවායින් එම සමාජය මුදවාගත් ආකාරය පිළිබඳව විමර්ශනය කරන්න. (ලකුණු 10යි)

(ii) ඉස්ලාම් සමාජ ව්‍යූහයෙහි සුවිශේෂී ලක්ෂණ **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**8.** පහත සඳහන් මාතෘකා ගැන කෙටි සටහන් ලියන්න.

(i) ඉජ්මාඋ සරීහ් (ලකුණු 05යි)

(ii) ඉස්ලාමීහි ඉපැයීමේ වැදගත්කම (ලකුණු 05යි)

(iii) ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික සම්ප්‍රදායික දායකත්වය (ලකුණු 05යි)

(iv) ඉස්ලාම්, මිනිසාට ලබා දී ඇති උසස් තත්වය (ලකුණු 05යි)

* * *

Department Of Examinations , Sri Lanka